**ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව - 2019**
**----------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ (කමිටුව) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, සංචිත හා අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ඔලිම්පික් කමිටුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කමිටුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම්වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික ඔලිම්පික් කමිටුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

  - යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික ඔලිම්පික් කමිටුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කමිටුව ක්‍රියා කර ඇති බව,
  - ජාතික ඔලිම්පික් කමිටුවේ සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

  - ජාතික ඔලිම්පික් කමිටුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියෙහි 17 වන පරිච්ඡේදයෙහි 17.33 ඡේදය ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද ප්‍රත්‍යාගණනයට අදාළව ස්වාධීන තක්සේරුකරුවෙකු ප්‍රත්‍යාගණනය කළේද, අයිතමයන්ගේ සාධාරණ අගය, ඇස්තමේන්තු කිරීමේදී යොදාගත් ක්‍රම හා වැදගත් උපකල්පන සෑම ප්‍රත්‍යාගනිත දේපල පිරියත හා උපකරණ පන්තියක් සඳහා පිරිවැය ක්‍රමය යටතේ හඳුනාගත් වත්කම්වල ඉදිරියට ගෙන යන අගය සහ කාල පරිච්ඡේදයේ වෙනස දැක්වෙන ප්‍රත්‍යාගණන අතිරික්තයට සහ බෙදා හැරීම සඳහා සීමාවන් පෙන්නුම් කරන ශේෂය සහිත හඳුනාගත් ඉදිරියට ගෙන යන අගය ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වරලත් තක්සේරුකරු විසින් 2019.12.31 දිනට ප්‍රත්‍යාගනනයක් සිදුකර ඇති බව ජාතික ඔලිම්පික් කමිටුව ප්‍රතිපත්ති මගින් හෙළිදරව් කර ඇති අතර එය අයිතමයේ සාධාරණ අගයන් තක්සේරු කිරිමේදී අදාළවන සියලු උපකල්පනයන් සමග දක්වා ඇත. එය වාර්තාවේද පැහැදිලිව විස්තර කර ඇත. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය හෙළිදරව් කිරීමට ක්‍රියා කළ යුතු වීම. |

## 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | වටිනාකම | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| තොග අයිතම 06 | රු. 5,632,431 | තොග අගය කිරිමේ වාර්තා | අප භෞතික සත්‍යාපනය පමණක් සිදුකර තිබුණි. 2020 වර්ෂයේදී ගැටළුව නිරාකරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | තොග වටිනාකම තහවුරු කර ගැනීම සඳහා තොගඅගය කිරීමේ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

## 1.6 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ නිකුත් කළ 1993 ජුනි 29 දිනැති අංක 773/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය | (i) ජාතික ඔලිම්පික් කමිටුව විසින් දේශිය හා ජාත්‍යන්තර වශයෙන් ලැබෙන ප්‍රදානයන් සම්බන්ධයෙන් වාර්තාවක් ත්‍රෛමාසිකව ක්‍රීඩා අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත් 2019 වර්ෂය සඳහා එම වාර්තා ඉදිරිපත් කිරීමට කමිටුව අසමත් වී ඇත. | ජාතික ඔලිම්පික් කමිටුව පාලනය කරනු ලබන්නේ අන්තර් ජාතික ඔලිම්පික් කමිටුවේ අනුමත ව්‍යවස්ථාව මගිනි. ඔලිම්පික් කමිටුව වෙනුවෙන් සංචාරය කළ සෑම සාමාජිකයෙකුම සෑමවිටම විධායක සාමාජිකයන්ට ඔවුන්ගේ මාසික රැස්වීමේදී ඒ පිළිබඳව විස්තර කරනු ලබන අතර මෙය පුරුද්දක් ලෙස සිදු කරනු ලබයි. අමාත්‍යංශයට වාර්තා කිරීම සම්බන්ධයෙන් ඔබ විසින් පළ කරන ලද ප්‍රශ්නය ඇතුළුව ජාතික ඔලිම්පික් කමිටුවේ මෙහෙයුම් වල සියලුම අංශ ආවරණය වන පරිදි අපගේ වාර්ෂික වාර්තාව ලබාදී ඇත. | ජාතික ඔලිම්පික් කමිටුව විසින් දේශියව හා ජාත්‍යන්තර වශයෙන් ලැබෙන ප්‍රදානයන් සම්බන්ධයෙන් කාර්තුමය වාර්තාවක් ක්‍රීඩා අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | (ii) ජාතික ඔලිම්පික් කමිටුව විසින් රැස්වීම් සඳහා විදේශ සංචාර වලට සහභාගී වී නැවත දිවයිනට පැමිණි දින සිට දින 30 ක් ඇතුලත විස්තරාත්මක වාර්තාවක් ක්‍රීඩා අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත් විදේශ සංචාර වලට සහභාගී වූ නිලධාරීන් අවශ්‍ය වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික ඔලිම්පික් කමිටුව පාලනය කරනු ලබන්නේ අන්තර් ජාතික ඔලිම්පික් කමිටුවේ අනුමත ව්‍යවස්ථාව මගිනි. ඔලිම්පික් කමිටුව වෙනුවෙන් සංචාරය කළ සෑම සාමාජිකයෙකුම සෑමවිටම විධායක සාමාජිකයන්ට ඔවුන්ගේ මාසික රැස්වීමේදි ඒ පිළිබඳව විස්තර කරනු ලබන අතර මෙය පුරුද්දක් ලෙස සිදු කරනු ලබයි. අමාත්‍යාංශයට වාර්තා කිරීම සම්බන්ධයෙන් ඔබ විසින් පළ කරන ලද ප්‍රශ්නය ඇතුළුව ජාතික ඔලිම්පික් කමිටුවේ මෙහෙයුම් වල සියලුම අංශ ආවරණය වන පරිදි අපගේ වාර්ෂික වාර්තාව ලබාදී ඇත. | ජාතික ඔලිම්පික් කමිටුව විසින් විදේශ සංචාර සම්බන්ධයෙන් විස්තරාත්මක වාර්තාවක් ක්‍රීඩා අමාත්‍යාංශයට ඉදිරිපත් කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.20,405,204 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,596,940 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,808,264 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු ආදායම රු.3,798,003 කින් අඩුවීම සහ මෙහෙයුම් වියදම් රු. 4,053,978 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ සාමාජිකයන් ලෙස ජාතික සම්මේලන 34 ක් ලියාපදිංචි කර තිබුණි. ජාතික සම්මේලන 34 අතරින් සාමාජිකයන් 32 දෙනෙකුට 2019 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රදානයන් රු.6,850, 000 පමණක් ලබාදී ඇති අතර සාමාජිකයන් 04 දෙනෙකුට 2019 වර්ෂය සඳහා වෙනත් ව්‍යාපෘති සම්බන්ධයෙන් රු. 5,933,292 ක අරමුදල් ලබාදී ඇත. සම්මේලන 17 ක් අතර ලබාදී තිබුණු රු.8,630,073 ක් සඳහා අදාළ ලියවිලි එම සම්මේලන වලින් ලබාගෙන නොතිබුණි. | පෙර පැවති කමිටුව විසින් අනුමත කරන ලද ක්‍රියාපටිපාටිය නම්, ජාතික සම්මේලන යම් යම් අවශ්‍යතාවයන්ට අනුකූලව වර්ෂය තුළ ඔවුන්ගේ වාර්ෂික ප්‍රදාන සහ ව්‍යාපෘති සම්බන්ධ වියදම් සඳහා ඉල්ලුම් කළ යුතුය. ජාතික සම්මේලන ඒ ආකාරයට අනුකූල නොවී ප්‍රදාන සහ ව්‍යාපෘති වියදම් සඳහන් ඉල්ලුම් කළහොත් ජාතික ඔලිම්පික් කමිටුවට අරමුදල් නිදහස් කළ නොහැකි අතර ජාතික සම්මේලනය එවැනි ක්‍රියාවන්ට වගකිව යුතු නොවේ. අදාළ නිරීක්ෂණය පිළිබඳව එකඟවිය නොහැක. ජාතික ඔලිම්පික් කමිටුව ඔවුන්ගේ ප්‍රදාන බෙදා දීමේදී කිසිදු පක්ෂපාතිභාවයකින් තොරව කටයුතු කරන බව දන්වා සිටිමි. | අදාළ ලියකියවිලි ලබා ගැනිමෙන් පසුව ජාතික ඔලිම්පික් කමිටුව සාමාජික සම්මේලනය වෙත අරමුදල් නිදහස් කළ යුතු වීම. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අපි එය 2020 වසර සඳහා පිළියෙල කරන්නෙමු. ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් එක හා සමාන නොවන බැවින් ජාතික ඔලිම්පික් කමිටුවේ ක්‍රියාකාරීත්වය වසරින් වසර වෙනස් වේ. එසේ වුවත්, ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර සෑම ක්‍රියාකාරකමක් සඳහාම විස්තරාත්මක අයවැයක් සකස් කරනු ලැබේ. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඔලිම්පික් කමිටුවේ කාර්යමණ්ඩලය සඳහා නිසි බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර නොතිබුණි. | අපගේ විශාල ලාභ ඉපයීමේ මෙහෙයුම් නොමැති බැවින් පිරිවැය අවම මට්ටමක පවත්වා ගැනීම සඳහා අවම කාර්ය මණ්ඩලයක් සමඟ කළමනාකරණය කරයි. ඕනෑම නව ක්‍රියාකාරකමක් හෝ සිදු කරන ලද ව්‍යාපෘතියක් මත පදනම්ව අවශ්‍ය වූ විට විධායක කමිටු අනුමැතිය ඇතිව නිසි ඇගයීමක් සිදු කර අවශ්‍ය බඳවා ගැනීම් සිදු කරයි. මෙය දැනට ජාතික ඔලිම්පික් කමිටුවේ අවශ්‍යතාවයක් ලෙස අප දකින්නේ නැත. හැකි සෑම විටම අපගේ ව්‍යපෘති සඳහා ස්වේච්චා සේවකයන් යොදා ගනී. | ඵලදායි මනාව සම්පත් පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා සේවක සංඛ්‍යාව හා බදවා ගැනීමේ පරිපාටිය සකස් කර අනුමැතිය ලබාගත යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කමිටුව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අපගේ උපාය මාර්ග සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා උපාය මාර්ගික සැසිවාරයක් පැවැත්වීමට 2020 අයවැයෙන් අපට ප්‍රතිපාදන තිබේ. | කමිටුවේ අනාගත දිශානතිය ඇතුලත් සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. |